

කාර්ය සාධන වාර්තාව

செயலாற்றல் அறிக்கை

Performance Report

2021

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

ஆரம்ப சுகாதார சேவைகள், தொற்று நோய்கள் மற்றும் கொவிட் கட்டுப்பாட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சு

State Ministry of Primary Health Care, Epidemics and COVID Disease Control



2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 441

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
දෙවන මහල, නො.525, යුනියන් පෙදෙස, කොළඹ - 02.
E-Mail: covidsecretaryoffice@gmail.com

පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ---------- 1-5

1.1 හැඳින්වීම.....1
1.2 අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු.....2
1.3 ප්‍රධාන කාර්යයන්.....3
1.4 සංවිධාන සටහන.....4
1.5 අමාත්‍යාංශයේ අධීක්ෂණයට අයත් වන ආයතන.....5

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම ---------- 6-7

2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2021 අනුව ප්‍රගතිය හා ජයග්‍රහණ.....6
2.2 අභියෝග.....7
2.3 ඉදිරි ඉලක්ක.....7

03 පරිච්ඡේදය - 2021 වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ---------- 8-19

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.....8
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....9
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය.....10
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්. 11
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.....11
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය.....11
3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් ආයතන වෙත ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....11
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 12
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව.....13

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක---------- 20-21

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 20
4.2 අපේක්ෂිත කාර්ය සාධනයට ළඟා වීමට නොහැකිවීම සාධාරණීකරණය.....21

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය ----- 22-24

5.1 මෙම රාජ්‍ය අමාත්‍යාංශයට අදාළව හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG).....22
5.1.1 හැඳින්වීම.....22
5.1.2 හඳුනා ගත් තිරසාර සංවර්ධන අරමුණු (SDG) භාවිතය 23
5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග.....24

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ---------- 25-28

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.....25
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය.....26
6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය.....28

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ---------- 29-34

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 2205/14 හා 2020 දෙසැම්බර් 11 දිනැති ව නිකුත් වූ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවන ලදී. මෙම රාජ්‍ය අමාත්‍යාංශය තම කාර්යභාරය ඉටු කරනු ලබන්නේ කැබිනට් අමාත්‍යාංශය වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ මැදිහත්වීම හා සම්බන්ධීකරණය යටතේය.

ශ්‍රී ලංකාව තුළ වෙසෙන සමාජ අවධානයෙන් බැහැර වූ හා අඩු අවධානයක් යොමු වන ප්‍රජාවන් මෙන්ම අඩු ආදායම්ලාභී හෝ ජීවන තත්ත්වය නහා සිටුවිය යුතු යැයි හඳුනාගත් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණ පෙරදැරිව මෙම අමාත්‍යාංශය සිය කාර්යයන් ඉටු කරනු ලැබීය.

අමාත්‍යාංශයේ මෙහෙවරට අනුගත වෙමින් 2021 වර්ෂයට ලැබී ඇති ප්‍රතිපාදනවලට අනුකූලව මෙම අමාත්‍යාංශය ස්ථාපිත කිරීමේ මූලික කටයුතු සැලසුම් සහගතව ක්‍රියාත්මක කරන ලදී.

මෙම අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණයට අයත් වන සමාජ සේවා දෙපාර්තමේන්තුවේත්, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේත්, 1990 සුව සැරිය පදනමේත් ප්‍රධාන අරමුණු හා ඉලක්ක ඉටු කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය වශයෙන් මහඟු කාර්යභාරයක් ඉටු කරන ලදී.

එසේම ඉහත ආයතන ජාතික මට්ටමින් සංවිධානය කරනු ලබන සියලුම වැඩසටහන් හා උත්සව සඳහා අවශ්‍ය අධීක්ෂණ හා උපදේශන ලබාදීම සිදුකරනු ලබන අතර එමඟින් අවම අවධානයක් යොමු වූ ප්‍රජාව කෙරෙහි සමාජ අවධානය යොමු කරවීමට හැකි වී ඇත.

එමෙන්ම දෙපාර්තමේන්තු, ආයතන හා මෙම අමාත්‍යාංශය යටතේ සිටින නිලධාරීන්ගේ දැනුම ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩමුළු සංවිධානය කරමින් සේවකයින් අභිප්‍රේරණය හා ඵලදායිතාව වර්ධනය කරමින් දේශීය විදේශීය පුහුණු අවස්ථාවන්ට යොමුකිරීම සඳහා කටයුතු සිදුකරනු ලැබීය.

ගෝලීය වසංගතයක් වන COVID-19 වසංගත තත්ත්වය හමුවේ වසරේ සැලකිය යුතු කාලසීමාවක් මුළු දිවයිනටම නිරෝධායන ඇඳිරිනීතිය බල පැවැත්විණි. නිරෝධායන ඇඳිරිනීතිය ඉවත් කළ ද අවම කාර්ය මණ්ඩලයක් කාර්යාල වෙත කැඳවීමට සෞඛ්‍ය අංශ වෙතින් ලබා දුන් උපදෙස් පරිදි කටයුතු කිරීම හේතුවෙන් හා පුද්ගල ඒකරාශී කිරීම් සිදු නොකිරීමට දෙන ලද උපදෙස් පිළිපැදිය යුතු වීම හේතුවෙන් අනෙකුත් වර්ෂයන්හිදී මෙන් සියලු කටයුතු එපරිද්දෙන්ම සිදු කිරීමට බාධා එල්ලවිණි.

කෙසේ නමුත්, එම බාධා මධ්‍යයේ වුව ද මෙම රාජ්‍ය අමාත්‍යාංශය විසින් පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන සපයා ගනිමින් 2021 වර්ෂයේ සිදු කරනු ලැබූ සියලු වැඩසටහන්, මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇති අතර, වැය ශීර්ෂ 441 යටතේ 2021 වර්ෂයට අදාළ ව සමස්ත මූල්‍ය කාර්ය සාධනය මෙහි අන්තර්ගත වී ඇත.

1.2 අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සමාජ අවධානයෙන් බැහැර වූ ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම.

මෙහෙවර

ශ්‍රී ලංකාව තුළ වෙසෙන, ජනතා අවධානයෙන් බැහැර වූ ප්‍රජාවන් වන විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ද හඳුනාගැනීම, ඔවුන්ගේ ජීවන තත්ත්වයන් ඉහළ නැංවීම සහ ශ්‍රී ලාංකීය ජනතාවගේ දිවි සුරැකීම වෙනුවෙන් පහසුකම් සැපයීම.

අරමුණු

- 1990 සුව සැරිය පදනම මඟින් ක්‍රියාත්මක ගිලන් රථ සේවාව තවදුරටත් ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීම තුළින් ජනතා අවශ්‍යතා ඉටු කිරීම.
- විශේෂිත අවශ්‍යතා සහිත තැනැත්තන්ගේ ජීවනෝපාය මාර්ග පුහුණු අවස්ථා සැලසීම සඳහා වන ප්‍රතිපත්ති සකස් කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම
- විශේෂිත අවශ්‍යතා සහිත දරුවන් සඳහා වන මාර්ගෝපදේශනය පිළිබඳ ප්‍රතිපත්ති සකස් කිරීම හා අදාළ කටයුතු සම්බන්ධීකරණය තුළින් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම.
- මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය සඳහා වන පහසුකම් වැඩිදියුණු කිරීමට උපදෙස් ලබා දීම හා මඟ පෙන්වීම තුළින් ඔවුන් යහමගට ගැනීම.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය තුළින් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරැකීම හා බලගැන්වීම.
- වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ සභාපති ලෙස මෙම රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නිලබලයෙන් පත් වන බැවින් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ කටයුතු සෘජු අධීක්ෂණය හා මඟ පෙන්වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන් සඳහා අධීක්ෂණය හා අවශ්‍ය උපදේශනය සිදුකිරීම.
- ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මඟින් සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන් අධීක්ෂණය හා අවශ්‍ය මඟ පෙන්වීම සිදුකිරීම.
- 1990 සුව සැරිය පදනම මඟින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයන් සඳහා අධීක්ෂණය හා අවශ්‍ය අවස්ථාවන් වලදී උපදෙස් ලබා දීම.
- වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සම්බන්ධ සියලු රාජකාරි අධීක්ෂණය හා ක්‍රියාත්මක කිරීම.
- දෘශ්‍යබාධිත පුනරුත්ථාපන භාර අරමුදල සම්බන්ධ සියලු රාජකාරි අධීක්ෂණය හා ක්‍රියාත්මක කිරීම.
- සුව සැරිය සඳහා අවශ්‍ය ගිලන් රථ මිලදීගැනීම හා සම්බන්ධ අනෙකුත් කාර්ය අධීක්ෂණය.
- ආයතනවල හා අමාත්‍යාංශ නිලධාරීන්ගේ දැනුම කුසලතා ආකල්ප වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිරන්තර පුහුණුව සිදුකිරීම, වැඩමුලු සංවිධානය කිරීම හා අවශ්‍ය සහාය ලබාදීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ඒ අනුව කාර්ය සාධන වාර්තාව සකස් කිරීම.

1.4 සංවිධාන සටහන


ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
සංවිධාන සටහන
ගරු අමාත්‍යතුමිය
අමාත්‍යාංශ ලේකම්
SL 04

1.5 අමාත්‍යාංශයේ අධීක්ෂණයට අයත් වන ආයතන

1. 1990 සුව සැරිය පදනම
2. සමාජ සේවා දෙපාර්තමේන්තුව
3. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය

1. 1990 සුව සැරිය පදනම

හැඳින්වීම

“1990 සුව සැරිය” නොමිලේ ලබා දෙන ගිලන් රථ සේවාව, ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට, 2016 ජූලි 28 දින දකුණ බස්නාහිර පළාත්වල අංගසම්පූර්ණ ගිලන් රථ 88 ක් සහිතව රාජගිරියේ පිහිටුවා ඇති හදිසි අණදීම් හා පාලන මධ්‍යස්ථානය සමඟින් සිය පුරෝගාමී ගමන ආරම්භ කළේය. දිවයින තුළ ඵලදායී හා ගුණාත්මක පූර්ව රෝහල් හදිසි සත්කාර සේවාවන් සැපයීම සඳහා දැනට මෙම සේවාව ගිලන් රථ 297කින් මුළු රටම ආවරණය කරයි.

2. සමාජ සේවා දෙපාර්තමේන්තුව

හැඳින්වීම

ආබාධිත සහිත ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ, ආර්ථික යහ පැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා ආබාධිත තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව ලබාදීම, ඔවුන් රැකියා හා ස්වයං රැකියා වලට යොමු කිරීම, ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන් තුළින් ආබාධිත ප්‍රජාව සවිබල ගැන්වීම, මත්ලෝලී පුනරුත්ථාපනය කිරීම, විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත්වීම් තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යනය සඳහා යොමු කිරීම ඇතුළු කාර්යයන් රාශියක් සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් කරනු ලබයි.

3. වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව හා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

හැඳින්වීම

2011 අංක 5 දරන පනතින් සංශෝධිත 2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේ පනත මඟින් ශ්‍රී ලාංකික ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම උදෙසා වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත බලය පවරා ඇති අතර එහි පරිපාලනමය කටයුතු සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත.

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම - 2021 අනුව ප්‍රගතිය හා ජයග්‍රහණ

1. වැඩ පරිසරයක් ඇති කර ගැනීම උදෙසා ඉඩකඩ සහිත ස්ථානයක රාජ්‍ය අමාත්‍යාංශය ස්ථාපිත කිරීම සිදු කර ඇත.

- අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021.08.17 දින ලැබී ඇත.
- කොලොන්නාව රජයේ කර්මාන්ත ශාලාව වෙත, ගොඩනැගිලි සංවර්ධන කටයුතු භාර දීම 2021.09.02 සිදු කරන ලදි.
- විදුලිය, ජලය, වායු සමීකරණ පහසුකම ලබා ගැනීම අවසන්ය.
- කාර්යාල ලී බඩු, උපකරණ, පරිගණක, ලිපි ද්‍රව්‍ය ආදී අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සපයා ගැනීම සිදු කර ඇත.
- රාජ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ කටයුතු සුබ මොහොතින් ආරම්භ කිරීම 2021.12.30 දින සිදු කරන ලදි. කාර්ය මණ්ඩලය සමඟ රාජකාරි කටයුතු 2022.01.03 දින ආරම්භ කරන ලදි.

2. අප්‍රමාදව සේවාවන් ඉටු කිරීම තුළින් සේවාලාභීන් තෘප්තිමත් කිරීම උදෙසා සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලයක් ලබාගැනීමේ කාර්යය 2021.12.31 දිනට කිසියම් ප්‍රමාණයකට ඉටුකරගෙන ඇත.

- 2021.07.01 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් කාර්ය මණ්ඩලය අනුමත කර ඇත.
- එසේවුවද 2021.12.31 දිනට ද අත්‍යවශ්‍ය ම තනතුරු කීපයක් හැර අනෙක් තනතුරු සම්පූර්ණ වී නොතිබුණි. (මේ පිළිබඳව මානව සම්පත් පැති කඩෙහි [පරිච්ඡේදය 06] දක්වා ඇත.)
- නව කාර්ය මණ්ඩලය සඳහා සේවාස්ථ පුහුණුවක් (on the job training) ලබා දෙමින් කටයුතු කරන ලදි.

3. කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණයක් ඇති කර ගැනීම සඳහා එතෙක් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉටු කළ ගිණුම්කරණ ක්‍රියාවලිය මෙම රාජ්‍ය අමාත්‍යාංශයට පවරා ගන්නා ලදී.

- 2021.07.21 දින සිට ප්‍රධාන ගණකාධිකාරිවරියක් (1 ශ්‍රේණිය) ලැබී ඇත.
- පරිපූරක ඇස්තමේන්තුවක් සකසා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම මඟින් 2021 වර්ෂයේ ඔක්තෝබර් සිට අප රාජ්‍ය අමාත්‍යාංශයට ප්‍රතිපාදන සලසා ගැනීම සිදු කරන ලදි.
- ඒ අනුව මු.රෙ 135 බලතල පැවරීම මඟින් ගෙවීම් කටයුතු ක්‍රමානුකූල කරන ලදි.

4. මෙම රාජ්‍ය අමාත්‍යාංශයට අයත් සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හා 1990 සුව සැරිය පදනම යන ආයතන සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගන්නා ලදි.

- 1990 සුව සැරිය පදනම සඳහා නව ගිලන් රථ 60ක්, 'ඉටුකම' අරමුදලින් ලබා දීමට ජනාධිපති කාර්යාලයෙන් කටයුතු ඉටු කරමින් පවතී. ප්‍රසම්පාදන කටයුතු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සිදු කරනු ලැබේ.

2.2 අභියෝග

1. ඉතාමත් සීමිත කාර්ය මණ්ඩලයක් සමඟ රාජකාරි කටයුතු ඉටු කිරීමට සිදුවීම නිසා රාජකාරි පැවරීම විධිමත් ව කළ නො හැකි විය. ගිණුම් අංශය සඳහා එක් නිලධාරිනියක හා උපාධිධාරී අභ්‍යාස ලාභියකු අනුයුක්ත තිබූ අතර ආයතන කටයුතු සඳහා වරින් වර විෂයයන් මාරු කරමින් නිලධාරීන් යෙදීමට සිදු විය. (එක් එක් කාල වකවානුවල මෙම උපාධිධාරී අභ්‍යාසලාභීන් අප අමාත්‍යාංශයට සේවයට පැමිණීම නිසා විෂයයන් බෙදීම එක් එක් අවස්ථා වලදි වෙනස් කිරීමට සිදු විය.)

2. මාණ්ඩලික නිලධාරි තනතුරු සම්පූර්ණ නො වීම මත අධීක්ෂණ ක්‍රියාවලියෙහි දුෂ්කරතා ඇතිවිය. ප්‍රසම්පාදන කමිටු හෝ වෙනත් කමිටු සඳහා එකම නිලධාරියා නම් කිරීම සිදු විය.

3. ප්‍රධාන ගණකාධිකාරී ලෙස මුල් පත්වීමක් (1 ශ්‍රේණිය) ලැබීමත්, සහකාර ලේකම් ලෙස අලුත්ම නිලධාරියකු යොදා ගැනීමට සිදුවීමත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යක්ෂ (ක්‍රම සම්පාදන), ගණකාධිකාරී, අභ්‍යන්තර විගණක තනතුරු පුරප්පාඩු වීමත් රාජකාරි කටයුතු කිරීමේ දී දැඩි අභියෝගයක් විය.

4. රාජ්‍ය අමාත්‍යාංශ කාර්යාලය සෞඛ්‍ය අමාත්‍යාංශයේ එක් කාමරයක පවත්වා ගෙන යාමට සිදුවීම වර්ෂය මුළුල්ලේ ම විශාල අභියෝගයක් විය. අමාත්‍යාංශ ලේකම් ඇතුළු නිලධාරීන් සඳහා මෙම කාමරයේ මේස හා පුටු සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ම ලබාගෙන කටයුතු කිරීමට සිදු වූ අතර, COVID-19 තත්ත්වය මත වරින් වර නිලධාරීන් සේවයට කැඳවීම මඟින් කටයුතු කිරීමට සිදු විය.

5. පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් 2021 ඔක්තෝබර් මාසයේ සිට රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපාදන වෙන් කර ලබා දුන් අතර, නවක නිලධාරීන් සමග විධිමත් ගිණුම් ක්‍රියාවලියකට අනුගතවීමේදී දැඩි දුෂ්කරතාවයකට මුහුණ දීමට සිදු විය. ගිණුම්කරණය පිළිබඳව කිසිදු දැනුමක් නොමැති උපාධිධාරී අභ්‍යාසලාභීන් සමඟ කටයුතු කිරීමේ දී ප්‍රධාන ගණකාධිකාරිවරියටම එම, කටයුතුවල යෙදීමට සිදු වූ අතර, අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම්, සහකාර ලේකම් විසින් ඒ වෙනුවෙන් දැඩි සහායක් ලබා දෙනු ලැබීය.

2.3 ඉදිරි ඉලක්ක

1. මෙම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා පැවරී ඇති බලතල ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය අනුමත කාර්ය මණ්ඩලයට අයත් තනතුරු වලට නිලධාරීන් ලබා ගැනීම මඟින් අමාත්‍යාංශයේ කටයුතුවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම.
   (අනුමත සේවක සංඛ්‍යාව = 80 සේවය කල සංඛ්‍යාව = 18)

2. 1990 සුව සැරිය පදනම සඳහා අවශ්‍ය ගිලන් රථ සපයා ගැනීම සඳහා කටයුතු කිරීම.
   ‘ඉටුකම’ ජනාධිපති අරමුදල - ගිලන් රථ 60
   ADB/ ව්‍යාපෘතිය - ගිලන් රථ 45

3. ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ලෙස නම් කර තිබුණ ද, ගැසට් නිවේදනය මඟින් බලතල පැවරීමේ දී අදාළ ව්‍යවස්ථාපිත ආයතන ලෙස සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ආයතන කිසිවක් නොමැති වීම හා එහි බලතල කිසිවක් නො පැවරීම මත, අමාත්‍යාංශයේ නම අනුව කටයුතු කළ නොහැකි වී ඇත. ඒ බව ජනාධිපති ලේකම්තුමා වෙත හා රාජ්‍ය ගිණුම් කාරක සභාවට ද දන්වා ඇති අතර, අප රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ ආයතන වන සමාජ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හා 1990 සුව සැරිය පදනම අනුව අමාත්‍යාංශයේ නම ගැළපෙන ආකාරයට සංශෝධනය කර ගැසට් පත්‍රයේ පළ කර ගැනීම හෝ බලතල පැවරුමක් සිදුවීම අපේක්ෂා කරනු ලැබේ.

03 පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය රු.

අයවැය (2021)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		41,810,000	-	ඒසීඒ-3
-	තැන්පතු		402,221	-	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		-	-	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**42,212,221**	-	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**42,212,221**	-	
-	**භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)**		947479	-	
-	**ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)**		41264742	-	
-	**අඩු කළා: වියදම්**				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
-	වැටුප්, චේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	23,258,747	-	ඒසීඒ-2(ii)
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	19,784,623	-	
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	12,129,164,114	-	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
-	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**12,172,207,484**		
	මූලධන වියදම්		-		
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	13,312,036	-	ඒසීඒ-2(ii)
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	9,902,906	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	68,676,650	-	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
-	හැකියා වර්ධනය	**14**	-	-	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
-	**මුළු මූලධන වියදම් (උ)**		**91,891,592**	-	
	තැන්පතු ගෙවීම්		402,221	-	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		-	-	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්			-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		402,221	-	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		12,264,501,296	-	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(12,223,236,554)		
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(12,223,236,554)**	-	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය				ඒසීඒ-3

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2021 රු.	2020 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	9,902,906	-
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	6,009,960	-
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
		-	
මුළු වත්කම්		**15,912,866**	-
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		9,902,906	-
දේපළ පිරියත හා උපකරණ සංචිතය		-	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	6,009,960	
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	-	-
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**15,912,866**	-

පිටු අංක 07 සිට 74 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 75 සිට 82 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	..... 2022/2/24	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : වෛද්‍ය එස්. එච්. මුණසිංහ	නම :	නම :
තනතුර : සෞඛ්‍ය අමාත්‍යාංශය "සුවසිරිපාය"	තනතුර : සුනේතා ගුණවර්ධණ	දිනය : 2022/02/24
දිනය : 25/02/2022	දිනය : ලේකම්	

ලේකම්
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත
කොළඹ 10.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
දෙවන මහල, අංක. 525, යුනියන් පෙදෙස,
කොළඹ 02.

ඒම්. පී. සී. පුෂ්පකුමාරි
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
දෙවන මහල, අංක. 525, යුනියන් පෙදෙස,
කොළඹ 02.

2

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය **ඒසීඒ-සී**

	තත්‍ය	
	වර්තමාන වර්ෂය	ඉකුත් වර්ෂය
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	93,314	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	41,810,000	-
අත්තිකාරම් අයකර ගැනීම්	-	-
තැන්පතු ලැබීම්	402,222	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**42,305,536**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	18,893,259	-
සහනාධාර සහ මාරුකිරීම්	7,603	-
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	947,479	-
අත්තිකාරම් ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	402,222	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**20,250,563**	**-**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**22,054,973**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	22,054,973	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**22,054,973**	**-**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(22,054,973)**	**-**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**-**

<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්: අදාළ නොවේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය: අදාළ නොවේ.

රු.000'

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තර	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු.000'

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්ථන	12,450,700	12,440,700	12,172,207	97.80
ප්‍රාග්ධන	273,000	283,000	91,891	32.47

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන: අදාළ නොවේ.

රු.000'

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000'

වත්කම් කේතය	කේත විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ		9,902		
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය எனது இல. My No. } MED/B/SMPHEC/02/2021/56

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2022 මැයි 31 දින

ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය

ප්‍රාථමික සෞඛ්‍ය සේවා,වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව ඉදිරියේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

පිටුව 1 | 7

අංක 306/72, පොළඳුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සමාලෝචිත වර්ෂය සඳහා සැලසුම්කර තිබුණු පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිම මුදල රු.65,376,800 ක් වුවද, රු.58,076,700 ක් පමණක් ඉල්ලුම් කර තිබුණි. ඒ අනුව අග්‍රිම සැලසුම් කිරීම මඟින් අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. කෙසේ වුවද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.41,810,000 ක් පමණක් වූයෙන් රු.16,266,700 ක අග්‍රිම නිකුත් නොකිරීම නිසා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කළ නොහැකිවී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව පහතින් දැක්වෙන නිරීක්ෂණවලට අනුව තහවුරු විය.

(අ) පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.3,000,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම, මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි. තවද පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු

රු.1,500,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන්, රු.1,300,000 ක් හෙවත් සියයට 80 ත් සියයට 90 ත් අතර ප්‍රතිශතයකින් මුදල් රෙගුලාසි 66 හා 69 මඟින් වෙනත් වැය විෂයයන් වෙත මාරු කර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 02 ක් හා මූලධන වැය විෂයයන් 03 ක් සඳහා සලසා ගෙන තිබුණු පිළිවෙලින් රු.265,000,000 ක් හා රු.8,000,000 ක් වශයෙන් වූ ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු මඟින් හා මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් පිළිවෙලින් රු.603,000,000 කින් හා රු.35,350,000 කින් හෙවත් සියයට 100 සිට සියයට 300 දක්වා ප්‍රතිශතයන්ගෙන් වැඩි කර ගෙන තිබුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 07 ක් හා මූලධන වැය විෂයයන් 06 ක් සඳහා සලසා ගෙන තිබුණු එකතුව රු.61,500,000 ක ප්‍රතිපාදනවලින් රු.900,000 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.60,600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ඇ) මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 17 ක් සඳහා සලසාගෙන තිබුණු රු.286,700,000 ක්වූ ප්‍රතිපාදනවලින් රු.10,600,000 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුව ඉතිරි රු.276,100,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.190,163,190 ක ප්‍රතිපාදන උපයෝජනයට ගෙන නොතිබුණි. එම ඉතිරිවීම් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 99 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව පැවති රාජ්‍ය අමාත්‍යාතුමිය හා කාර්යමණ්ඩලයේ 2021 නොවැම්බර් හා දෙසැම්බර් මාසයන්හි දුරකථන බිල්පත් හා අනෙකුත් ගෙවීමට ඇති බිල්පත්වල එකතුව රු.70,537 ක් සටහන (iii) ආකෘතියට අනුව වූ 2021 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.

2.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

පිටුව 4 | 7

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 835(3) ප්‍රකාරව, රාජ්‍ය අමාත්‍යාංශය සඳහා කාර්යාලයීය ඉඩ පහසුකම් ලබා ගැනීම වෙනුවෙන් 2021 ඔක්තෝබර් 29 දින එළඹී තිබුණු බදු කුලී ගිවිසුම් සඳහා ඇටෝර්නි ජනරාල්වරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

2020 දෙසැම්බර් මස 11 දිනැති අංක 2205/14 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කොවිඩ් - 19 සහ වෙනත් බෝවන රෝග පාලනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා සම්බන්ධීකරණයෙන් සියලු පළාත් හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම, වසංගත රෝග ව්‍යාප්තවීම වැළැක්වීම සඳහා කටයුතු කිරීම හා මාතෘ හා ළදරු මරණ අවම රටක් ලෙස පවත්වා ගැනීමට මාතෘ හා ළදරු සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම, ග්‍රාමීය ජනතාවට පහසුවෙන් තම සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීමට හැකිවන පරිදි සියලුම ප්‍රාදේශීය හා ප්‍රාථමික රෝහල්වල වෛද්‍ය, හෙද හා ආශ්‍රිත අනෙකුත් සහායක පහසුකම් වැඩි දියුණු කිරීම, දරුවන්ගේ ප්‍රතිශක්තීකරණය වැඩිකිරීම සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රාථමික සෞඛ්‍ය සේවා හා මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම්, ජනතාවගේ සෞඛ්‍ය අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ග්‍රාමීය, පසුගාමී හා නාගරික ප්‍රදේශවල අඩු ආදායම්ලාභීන් ඉලක්ක කර ගනිමින් වැඩිහිටි සෞඛ්‍ය අවශ්‍යතා පහසුකම් පුළුල් කිරීම, සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, පවුල් සෞඛ්‍ය සේවා, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන සතු ඩිස්පැන්සරි හා මාතෘ සායන සම්බන්ධීකරණය කරමින් අඩු ආදායම්ලාභී සහ ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම සුවිශේෂී පුමුඛතා වුවද, රාජ්‍ය අමාත්‍යාංශයට මෙම කාර්යයන් ඉටු කිරීමට අදාළ අණපනත් ක්‍රියාත්මක කිරීමේ හෝ ආයතනවල භාරකාරිත්වය ඇතුළත් තීරණ ගැනීමේ බලතල පවරා දීමක් සිදුකර නොතිබුණි. මේ හේතුවෙන් 2021 වර්ෂයට අදාළව සකස්කර තිබුණු කෙටුම්පත් වාර්ෂික කර්යසාධන වාර්තාවේ රාජ්‍ය අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන් යටතේ ඉහත දැක්වෙන සුවිශේෂී ප්‍රමුඛතා කාර්යයන් සඳහන් කර නොතිබුණි.

3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්ද රජයේ ගිණුමට අදාළ වවුචර්, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශයට අයත් බැංකු ගිණුම පිළිබඳව කටයුතු කරන හා බඩු බාහිරාදිය භාරව සිටින නිලධාරීන් තිදෙනෙකු විසින් ඇප තැන්පත් කර නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

2017 අප්‍රේල් 19 දිනැතිව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු අංක 03/2017 දරන චක්‍රලේඛය ප්‍රකාරව, සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතුය. තවද 2017 මැයි 12 දිනැතිව භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිකුත් කර තිබුණු අංක DMS/0016 දරන ලිපිය ප්‍රකාරව, සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කළ හැකි පරිදි ඇඟිලි සළකුණු යන්ත්‍ර 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක නොකරන්නේ නම් වර්තමාන වැටුපට අනුව අතිකාල දීමනා නොගෙවීමට වගබලා ගත යුතු බව ලේකම්වරයාට දැනුම්දී තිබුණි. මෙම චක්‍රලේඛයේ හා ලිපියේ සඳහන් විධිවිධාන 2021 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් පැමිණීම පිටවීම සටහන් කිරීමකින් තොරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේදී වැටුප් සඳහා රු.12,821,220 ක්ද අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් රු.5,572,534 ක්ද ලෙස මුළු මුදල රු.18,393,754 ක් ගෙවා තිබුණි.

4 යහපාලනය

4.1 විගණන හා කළමනාකරණ කමිටු

2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (1), 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) සහ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව , කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2020 දෙසැම්බර් 4 දින ස්ථාපිත කර තිබුණු රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතට සමාජ සේවා දෙපාර්තමේන්තුව, වැඩිහිටි මහලේකම් කාර්යාලය හා 1990 සුවසැරිය පදනම් යන ආයතන පමණක් ඇතුළත් කර තිබුණු නමුත් රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය පිළිබඳව විධිමත් අධ්‍යයනයකින් තොරව 80 ක කාර්යමණ්ඩලයක් අනුමත කරවා ගෙන තිබුණි. වෛද්‍ය පරිපාලක සේවා තනතුරුවලට අදාළ රාජකාරි මෙම අමාත්‍යාංශය විසින් ඉටුනොකරන නමුත් අතිරේඛ ලේකම්වරයෙකු ඇතුළුව වෛද්‍ය පරිපාලක සේවා තනතුරු 05 ක් හා වෛද්‍ය නිලධාරි තනතුරු 03 ක් අනුමත කාර්ය මණ්ඩලයට අයත් විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ තත්‍ය සමස්ථ කාර්යමණ්ඩලය 15 ක් පමණක් විය.

අයි. සමරගේ
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටුව 7 | 7

04 පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	පරමාර්ථය	විශේෂ දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් % ලෙස තත්‍ය නිමැවුම		
			100%-90%	75%-89%	50%-74%
01	ප්‍රියමනාප වැඩ පරිසරයක් ඇති කර ගැනීම.	• උචිත කාර්යාල පරිශ්‍රයක් තුළ කාර්යක්ෂමතාවය වැඩි වීම හා ප්‍රමාද අඩු වීම.		✓	
		• සම්පූර්ණ වූ කාර්යාල උපකරණ හා ලී බඩු හා අවශ්‍යතා නිසා තෘප්තිමත් වූ කාර්ය මණ්ඩලය		✓	
02	මහජනතාව උදෙසා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම.	• අනුමත කරන ලද කාර්ය මණ්ඩලය	✓		
		• සම්පූර්ණ වූ බඳවා ගැනීම් හා අනුයුක්ත කිරීම් සංඛ්‍යාව			✓
		• තෘප්තිමත්ව කටයුතු කරන, දැනුමැති, කාර්යක්ෂම කාර්ය මණ්ඩලය			✓
03	කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණය	• ප්‍රධාන ගණකාධිකාරිවරයකු යටතේ විධිමත් පරිදි ගිණුම් කටයුතු ඉටු වීම.		✓	
		• පරිපූරක ඇස්තමේන්තුව අනුමතවීම හා ප්‍රතිපාදන ලැබීම.	✓		
		• මු.රෙ.135 බලතල පැවරීමේ ලේඛනය.	✓		
04	කාර්යක්ෂම ඵලදායී අන්තර් සම්බන්ධීකරණය	• ඉටු වූ මහජන ඉල්ලීම් සංඛ්‍යාව			✓
		• ඉටු කිරීමේ අපහසුතා පැහැදිලි කිරීම් සංඛ්‍යාව			✓
		• දෘශ්‍යාබාධිතවූවන් සඳහා සැලසූ සහන ප්‍රමාණය		✓	
		• ජ්‍යෙෂ්ඨ පුරවැසි ආබාධිතවූවන් සඳහා එම ආයතනවලින් ක්‍රියාත්මක ව්‍යාපෘති සංඛ්‍යාව.		✓	
		• විගණන වාර්තාවල කරුණු හා විගණන විමසුම් නොමැති වීම.	✓		
		• 1990 සුව සැරිය පදනම වෙත ලබා දුන් සහන හා ගිලන් රථ (ප්‍රතිපාදන)		✓	

4.2 අපේක්ෂිත කාර්ය සාධනයට ළඟා වීමට නොහැකිවීම සාධාරණීකරණය

1. අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු සම්පූර්ණ නො වීම මත නිලධාරි හිඟයක් තිබීමෙන් රාජකාරි පැවරීම් හා වැඩ බෙදීම් කටයුතු ඉතා දුෂ්කර තත්ත්වයක පැවතීම. (අනුමත සංඛ්‍යාව - 80, සිටි සංඛ්‍යාව - 18).

2. 2021 වර්ෂය තුළ COVID-19 රෝගී තත්ත්වයන් නිසා රටේ පැවති අයහපත් වාතාවරණය මත, සිටින ලද කාර්ය මණ්ඩලය හෝ අඛණ්ඩව සේවයට ගෙන්වා ගැනීමට නොහැකිවීම.

3. මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සමාජ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ද COVID-19 තත්ත්වය මත ප්‍රශස්ත මට්ටමකට රැගෙන ඒමට නො හැකි වීම.

05 පරිච්ඡේදය
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 මෙම රාජ්‍ය අමාත්‍යාංශයට අදාළව හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු (SDG)

5.1.1 හැඳින්වීම

SDG 1 –	සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම.
SDG 3	• නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේ ම සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.
3.1	• මාතෘ මරණ අනුපාතිකය අඩු කිරීම.
3.2	• අලුත උපන් හා වයස අවුරුදු 5ට අඩු ළමුන්ගේ වළක්වා ගත හැකි මරණ තුරන් කිරීම.
3.6	• මහාමාර්ගවල සිදු වන අනතුරුවලින් සිදු වන තුවාල වීම් හා මරණ සංඛ්‍යාව අඩු කිරීම.
SDG 4	• පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමට අවස්ථා සැලසීම.
4.5	• ආබාධිත පුද්ගලයන්ට හා අවදානමට ලක් විය හැකි ළමුන්ට වෘත්තීය පුහුණුව ලබා ගැනීමට අවස්ථාව සැලසීම.
SDG 6	• සැමට ජලය හා සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම හා ඒවායේ තිරසාර කළමනාකරණය සහතික කිරීම.
6.2	• සියලු දෙනාට ම ප්‍රමාණවත් හා සමානත්වයෙන් යුක්ත ව සනීපාරක්ෂාව ලබාගත හැකි වීම හා අවදානමට ලක් විය හැකි පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම.
SDG 8	• සියල්ලන් සඳහා යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.
8.5	• ආබාධිත පුද්ගලයන් හා යෞවනයන් ද ඇතුළුව සියල්ලන් සඳහා ඵලදායී රැකියා අවස්ථා ලබා දීම.
8.6	• අධ්‍යාපනය නොලබන, පුහුණුවක් නොලබන, රැකියා නොමැති යෞවනයන්ගේ සංඛ්‍යාව අඩු කිරීම.
SDG 16	• තිරසාර සංවර්ධනය සඳහා සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.
16.6	• සියළුම මට්ටම්වල දී ඵලදායී වග වීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.

5.1.2 හඳුනා ගත් තිරසාර සංවර්ධන අරමුණු (SDG) භාවිතය

ඉලක්ක/ අරමුණු (SDG)	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
16 (16.6)	❖ ප්‍රමාණවත් ඉඩකඩ සහිත කාර්යාලයක්	❖ සකස් කරගත් උචිත කාර්යාල පරිසරයක් ❖ සපයා ගත් කාර්යාල උපකරණ/භාණ්ඩ			√ √
8 (8.5 8.6)	❖ සුදුසුකම් සහිත වූ කාර්ය මණ්ඩලයක් සපයා ගැනීම ❖ පුහුණු තුලින් දැනුම කුසලතා වර්ධනය	❖ අනුයුක්ත කර ගත හැකි වූ කාර්ය මණ්ඩලය (මාණ්ඩලික - 04 මාණ්ඩලික නොවන - 14)	√		
16 (16.6)	❖ ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරා ගැනීම.	❖ 2021 ඔක්තෝබර් සිට ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට පැවරීම. ❖ පරිපූරක ඇස්තමේන්තුව අනුමත වීම හා මූල්‍ය ප්‍රතිපාදන සැලසීම. ❖ මු.රෙ.135 බලතල පැවරීම.			√ √ √
1 6.2	❖ මහජනතාවගේ ඉල්ලීම් සඳහා ඉක්මන් විසඳුම්/ප්‍රතිකාර ලබා දීම.	❖ දෘෂ්‍යාබාධිත පුනරුත්ථාපන අරමුදල මඟින් ආධාර හා පහසුකම් සැපයීමට හැකිවීම.		√	
4.5	❖ ආබාධ සහිත වූ වන් ජෝෂ්ඨ පුරවැසියන් සඳහා එම ආයතන වලින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සම්බන්ධීකරණය හා සහාය වීම.	❖ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හා ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ඉදිකිරීම් අවසන් කළ හැකි වීම හා ආරම්භ කළ හැකි වීම.		√	
3 (3.1 3.2 3.6)	❖ 1990 සුව සැරිය පදනම වෙත ගිලන් රථ ලබා දීම හා ප්‍රතිපාදන ලබා දීම.	❖ 1990 සුව සැරිය පදනම සඳහා ජනාධිපති ඉටුකම අරමුදලෙන් ගිලන්රථ 60ක් ලබාගැනීමට කටයුතු කරමින් පැවතීම.		√	

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

SDG 16.6 තිරසාර සංවර්ධනය සඳහා ඵලදායී, වගකීම් සහිත ආයතන ගොඩනැගීම යටතේ මෙම රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ගොඩනැගිලි හා කාර්යාල පහසුකම් ලබාගත හැකි වීමත්, උපකරණ, යන්ත්‍ර සූත්‍ර ආදිය සපයා ගනිමින් කාර්යාලය නව ස්ථානයක ස්ථාපිත කර ගැනීමට හැකි වීම ජයග්‍රහණයකි.

අභියෝග

1 **කාර්ය මණ්ඩලය අනුයුක්ත කර ගැනීම සම්පූර්ණ නොවීම.**

දැනට සම්පූර්ණ වූ පුරප්පාඩු වන්නේ උපාධිධාරීන් සඳහා වූ තනතුරු 15 හා මාණ්ඩලික ශ්‍රේණිවල තනතුරු 4 පමණි. අනිකුත් සියලු තනතුරු මේ දක්වා ම පුරප්පාඩු ලෙස පවතී. (මෙම තොරතුරු 06.2 පරිච්ඡේදයේ සඳහන් කර ඇත).

ඒ නිසා කාර්යාලයේ කටයුතු ඵලදායී ලෙස ඉටු කළ නොහැක. විශේෂයෙන් සැලසුම් අධ්‍යක්ෂ, ගණකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අභ්‍යන්තර විගණක හා පරිපාලන නිලධාරි තනතුරු 5 ම පුරප්පාඩු වන අතර, කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 18ම පුරප්පාඩු වේ.

2 මෙම රාජ්‍ය අමාත්‍යාංශයට පැවරී ඇති බලතල ප්‍රකාරව සමාජ සේවා , වැඩිහිටි මහ ලේකම් කාර්යාලය හා 1990 සුව සැරිය , යන විෂයයන් පිළිබඳව කටයුතු කළ යුතු වුව ද අමාත්‍යාංශයේ නම ” ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය” ලෙස සඳහන් ය. එම නාමයට අදාළ ආයතන කිසිවක් මෙම රාජ්‍ය අමාත්‍යාංශයට පැවරී නොමැති වුව ද, ප්‍රගතිය විමසීමේ දී හා රැස්වීම් සාකච්ඡා වල දී විමසනු ලබන්නේ එයට අදාළ වය. එසේම මහජනතාව විසින් ද, COVID – 19 රෝගයට අදාළ එන්නත් පිළිබඳව ද, සෞඛ්‍ය ගැටලු පිළිබඳව ද විමසන අතර, එවිට එම ගැටලු නැවත සෞඛ්‍ය අමාත්‍යාංශයට යොමු කරන අතර, එහිදී මහජන අප්‍රසාදයට ලක් වීමට සිදුවී ඇත.

3 2021 වර්ෂයට ප්‍රතිපාදන වෙන්කිරීමේදී 1990 සුව සැරිය පදනම සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර, ඒ නිසා වරින් වර මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ඉල්ලීමට සිදු විය. 1990 සුව සැරිය පදනම නොමිලේ ගිලන් රථ සේවාව ඉතා කාර්යක්ෂමව සපයන බැවින්, එහි නඩත්තු කටයුතු සියල්ල සඳහා ප්‍රතිපාදන ලබා දිය යුතු වේ.

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

ප්‍රාථමික සෞඛ්‍ය වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන අමාත්‍යාංශය සඳහා 2021.01.15 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් කාර්යය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

මෙම අමාත්‍යාංශයීය අනුමත කාර්යය මණ්ඩලය හා 2021.12.31 දිනට සේවයේ සිටි අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩලය පිළිබඳ තොරතුරු වගුව 01 හා වගුව 02 මඟින් දක්වා ඇත.

වගුව - 01

සේවා මට්ටම	අනුමත සේවක සංඛ්‍යාව	සේවයේ යෙදී සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	19	05*	15
තෘතියික	03	01	02
ද්විතීක	37	07**	34
ප්‍රාථමික	21	05***	19
එකතුව	**80**	**18**	**70**

වගුව - 02

ප්‍රාථමික සෞඛ්‍ය වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන අමාත්‍යාංශයේ 2021.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

සේවා මට්ටම	තනතුර	සේවය	පන්තිය/ ශ්‍රේණිය	2021.12.31 දිනට		
				අනුමත සේවක සංඛ්‍යාව	සත්‍ය ලෙස සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව	දිනට ඌන සේවක සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	ලේකම්	ශ්‍රී ලං.ප.සේ	විශේෂ	1	1	-
	අතිරේක ලේකම්	ශ්‍රී ලං.ප.සේ	විශේෂ	1	1	-
	අතිරේක ලේකම්	වෛ. ප.සේ.	නි.අ.ජ.	1	1*	1
	වෛද්‍ය නිලධාරි	ශ්‍රී ලං.වෛ.සේ.	ප්‍රා/II/I	3	-	3
	ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී ලං.ග.සේ.	I	1	1	-
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	ශ්‍රී ලං.ප.සේ	I	1	-	1
	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	වෛද්‍ය ප. සේ.	ජ්‍යෙ.වෛද්‍ය ප.ශ්‍රේ.	2	-	2
	ගණකාධිකාරි	ශ්‍රී ලං.ග.සේ.	III/II	2	-	2
	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලං.ග.සේ.	III/II	1	-	1
	අධ්‍යක්ෂ	වෛද්‍ය ප.සේ.	ජ්‍යෙ.වෛද්‍ය ප. ශ්‍රේ.	2	--	2
	අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ.	I	1	-	1
	සහකාරඅධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ	ශ්‍රී ලං.ක්‍ර.සේ.	III/II	1	-	1
	සහකාර ලේකම්	ශ්‍රී ලං.ප.සේ.	III/II	2	1	1

තෘතියික	පරිපාලන නිලධාරි	ක.සේ.නි.සේ	අධි පන්තිය	1	-	1
	ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්	තාවකාලික	-	1	1	-
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	ශ්‍රී ලං.තො.හා ස.තා.සේ.	II/I	01	-	1
ද්විතීයික	සංවර්ධන නිලධාරි	සං.නි.සේ.	III/II/I	15	7 **	12
	කළමනාකරණ සේවා නිලධාරි	ක.සේ.නි.සේ.	III/II/I	18	-	18
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී ලං.තො.හා ස.තා.සේ.	III/II/I	04	-	4
ප්‍රාථමික	රියදුරු	ඒ.රි.සේ.	III/II/I/ විශේෂ	10	-	10
	කාර්යාල කාර්ය සහායක	කා.සේ.සේ.	III/II/I/ විශේෂ	8	3 ***	8
	වීඩියෝ කැමරා ශිල්පී	තාවකාලික	-	1	-	1
	නිශ්චල ඡායරූප ශිල්පී	තාවකාලික	-	1	1	-
	ඡායාරූප ශිල්පි සහායක	තාවකාලික	-	1	1	-
එකතුව				**80**	**18**	**70**

*වැඩ බලන පදනමින් නිලධාරියෙක් පත්කර ඇත.

** ස්ථිර සේවයේ සංවර්ධන නිලධාරීන් තිදෙනෙක් ද උපාධිධාරි අභ්‍යාලාභීන් 4ක් ද සේවයේ නියුතු විය.

***බහුකාර්යය සංවර්ධන කාර්යය සාධක බලකා දෙපාර්තමේන්තුවෙන් පුහුණුව සඳහා අනුයුක්ත කරන ලද පුහුණුලාභීන් තිදෙනෙක් සේවයේ නියුතු විය.

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

අමාත්‍යාංශයීය අනුමත කාර්යය මණ්ඩලය 80 දෙනෙක් වුවද 2021.12.31 දින වන විටත් අමාත්‍යාංශයේ සේවයේ නියුතු සමස්ථ කාර්යය මණ්ඩලය 18කි. එම කාර්යය මණ්ඩලය පහත පරිදිය.

ලේකම්	- 01
අතිරේක ලේකම්	- 02*
ප්‍රධාන ගණකාධිකාරී	- 01
සහකාර ලේකම්	- 01
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් (තාවකාලික)	- 01
සංවර්ධන නිලධාරි	- 03
අභ්‍යාසලාභි උපාධිධාරීන්	- 04
කාර්යාල කාර්ය සහායක(බහුකාර්ය බලකාය)	- 03
ඡායාරූප ශිල්පි (තාවකාලික)	- 01
සහායක ඡායාරූප ශිල්පි(තාවකාලික)	- 01

*වැඩ බලන පදනමින් නිලධාරියෙක් පත්කර ඇත.

මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කාර්යය මණ්ඩලයෙන් තනතුරු 70ක් පුරප්පාඩුව පැවතීම අමාත්‍යාංශයීය කාර්යය සාධනය කෙරෙහි දැඩි ලෙස අහිතකර අන්දමින් බලපාන ලදී.

අමාත්‍යාංශය ආරම්භයේදී සේවයේ නියුතු කාර්යය මණ්ඩලය තිදෙනෙක් පමණක් වූ අතර (ලේකම්, ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් සහ කාර්යාල කාර්යය සහායක පමණි) සෙසු කාර්යය මණ්ඩලය 18ක් දක්වා වර්ධනය වූයේ 2021 නොවැම්බර් මාසයෙන් පසුවය. එතෙක් අමාත්‍යාංශයේ දෛනික කටයුතු ඉටුකරගෙන යෑම පවා අසීරු තත්ත්වයක පැවතුණි. එමෙන්ම නව කාර්යාලය ස්ථාපිත කිරීම හා නව කාර්යාලයකට අවශ්‍ය කාර්යාලයීය භාණ්ඩ, උපකරණ මිලදී ගැනීම යන මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට පවා එම කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීය.

කෙසේ වුවද එම සියලු මානව සම්පත් අභියෝග හමුවේ සේවයේ නියුතුව සිටින මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායි ලෙස යොදාගනිමින් මෙම අමාත්‍යාංශය සඳහා නව ගොඩනැගිල්ලක් කුලියට ගැනීම, කාර්යාල පරිශ්‍රයක් සකස් කර ගැනීම හා අවශ්‍ය කාර්යාල භාණ්ඩ හා උපකරණ මිලදී ගැනීමේ කාර්යයන් 2021.12.31 දින වන විට නිම කරන ලදි.

මෙම අමාත්‍යාංශය සඳහා ස්ථිර රියදුරන් නොසිටි අතර සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් තාවකාලික පදනමින් ලබා දෙන ලද රියදුරන් දෙදෙනෙක් මඟින් එම සේවාවන් ඉටුකර ගන්නා ලදි.

අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩල අනුමැතිය ලබාදීමේදී වෛද්‍ය නිලධාරීන් 08 දෙනෙක් මෙම අමාත්‍යාංශය සඳහා අනුමත කළද අමාත්‍යාංශයීය කාර්යභාරය හා නෛතික බලතල අනුව එම කාර්යය මණ්ඩලය සඳහා පැවරීමට රාජකාරියක් නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එම නිලධාරින්ද අදාළ කාලය තුළ මෙම අමාත්‍යාංශයීය කාර්ය මණ්ඩලය තුළ ඇතුලත් නොවීය.

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් වල දායකත්වය.

මෙම අමාත්‍යාංශය පිහිටුවා වසරක පමණ කෙටි කාලයක් වන බැවින්ද අමාත්‍යාංශය ආරම්භයේ ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් පමණක් (ලේකම්, සම්බන්ධීකරණ ලේකම් හා කාර්යාල කාර්ය සහායක යන තනතුරු පමණි) සිටි බැවින්ද වසර ආරම්භයේ සිට මාස 8ක් පමණ ගතවන තෙක්ම එසේ පුහුණු අවස්ථා සඳහා යොමු කිරීමට කාර්යය මණ්ඩලයක් නොසිටියේය. එමෙන්ම පැවැති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් බොහෝ පුහුණු අවස්ථාවන් නොතිබූ බවද නිරීක්ෂණය කරමි. කෙසේ වුවද වසර අවසානය වන විට අමාත්‍යාංශයීය කාර්යය මණ්ඩලය 18 (පුහුණු ලාභීන් හා සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ලබාදුන් කාර්යය මණ්ඩලය ද ඇතුළත්ව) දක්වා වර්ධනය වූ අතර නිලධාරීන් කිහිප දෙනෙකුට පුහුණු අවස්ථා ලබා දීමට හැකිවිය. එම තොරතුරු පහත පරිදි වේ.

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහන් කාලසීමාව	සමස්ත ආයෝජන රු.	වැඩසටහනේ ස්වාභාවය	නිමවුම ලබාගත් දැනුම
Large scale Survey on older person Experience from MARS	1	2021 දෙසැම්බර් 07/09	නැත	විදේශීය (Online)	වයස්ගතවුවන්/වැඩිහිටි ජනතාව පිළිබඳ මහාපරිමාණයේ සමීක්ෂණය කළයුතු ආකාරය පිළිබඳව
තොරතුරු පනත පිළිබඳ දැනුවත් කිරීම	1	2021 නොවැම්බර් 29	නැත	දේශීය	තොරතුරු පනත පිළිබඳ කරුණු
කාර්යාලයීය කටයුතු පිළිබඳ පුහුණු කිරීම	4 (උපාධිධාරී අභ්‍යාසලාභී)	මාස 04යි	නැත	සේවාස්ථ පුහුණුව	කාර්යාලයීය ලිපිගොනු කටයුතු පිළිබඳ දැනුම
කාර්යාල කාර්ය සහායක කාර්යයන් පුහුණුව	3 (බහුකාර්ය සංවර්ධන)	මාස 02යි	නැත	සේවාස්ථ පුහුණුව	කාර්යාල කාර්ය සහායක විසින් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ දැනුම

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ	2021 වර්ෂයට අත්තිකාරම් ‘බී’ ගිණුම සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත.	
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම.	2022 වර්ෂය සඳහා සකස් කර ඇත.
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොමැති වීම.	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අදාළ නොවේ	රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය කටයුතු 2021 ඔක්තෝබර් මස සිට ආරම්භ වූ අතර විගණන විමසුම් ඉදිරිපත් වී නොමැත.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/ 1- 2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොමැත.	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම	අදාළ නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොමැත.	

6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොමැත.	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	අභ්‍යන්තර විගණන නිලධාරියෙකු නොමැත.	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ.	අභ්‍යන්තර විගණන නිලධාරින් නොමැති වීම.	2022 වර්ෂයේ පළමු කාර්තුව සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම පවත්වන ලදී.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	රාජකාරි ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් නිලධාරින් නොමැති වීම.	ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු ක්‍රොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල නොවේ.	රාජකාරි ඉටුකර ගැනීම සඳහා ප්‍රමාණවත් නිලධාරින් නොමැති වීම.	ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු ක්‍රොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ.	භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාත්මක කරමින් පවතී.	නවක නිලධාරින් පුහුණු කිරීමට කටයුතු කර ඇත.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ.	භාණ්ඩ සමීක්ෂණ ක්‍රියාත්මක කරමින් පවතී.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අදාළ නොවේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අදාළ නොවේ	සංචිත වාහන නොමැත.	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නොවේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාළ නොවේ	වාහන නොමැත.	
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අදාළ නොවේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අදාළ නොවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අදාළ නොවේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අදාළ නොවේ	අත්තිකාරම් 'බී' ගිණුම සඳහා 2021 වර්ෂයට ප්‍රතිපාදන වෙන්වී නොතිබුණි.	
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අදාළ නොවේ		
12.3	වර්ෂයක වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ		

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාල රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ	නිල වෙබ් අඩවිය සක්‍රියව නොපැවතුණි.	නිල වෙබ් අඩවිය මේ වන විට සකසමින් පවතී.
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.	සකස් කරමින් පවතී.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම.	සකස් කරමින් පවතී.
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් සකස්කර නොමැත.	2022 වර්ෂයට සකස් කර ඇත.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් සකස්කර නොමැත.	2022 වර්ෂයට සකස් කර ඇත.
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් සකස්කර නොමැත.	2022 වර්ෂයට සකස් කර ඇත.
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ	කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් සකස්කර නොමැත.	2022 වර්ෂයට සකස් කර ඇත.
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අදාළ නොවේ		